ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

විෂයය අංකය / பாட இலக்கம் **45**

විෂයය / பாடம் **බෞද්ධ ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல. | නිවැරදි පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | නිවැරදි පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | නිවැරදි පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | නිවැරදි පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | නිවැරදි පිළිතුරු අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 3 | 21. | 5 | 31. | 1 | 41. | 1 |
| 02. | 2 | 12. | 1 | 22. | 4 | 32. | 5 | 42. | 4 |
| 03. | 3 | 13. | 5 | 23. | 5 | 33. | 2 | 43. | 5 |
| 04. | 2 | 14. | 2 | 24. | 3 | 34. | 2 | 44. | 1 |
| 05. | 4 | 15. | 2 | 25. | 1 | 35. | 5 | 45. | 3 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 3 | 46. | 2 |
| 07. | 4 | 17. | 1 | 27. | 1 | 37. | 4 | 47. | 5 |
| 08. | 3 | 18. | 2 | 28. | 4 | 38. | 3 | 48. | 2 |
| 09. | 4 | 19. | 3 | 29. | 1 | 39. | 2 | 49. | 5 |
| 10. | 1 | 20. | 4 | 30. | 3 | 40 | 1 | 50 | 5 |

❍විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

## I කොටස

### බෞද්ධ ශිෂ්ටාචාරය II

### I කොටස

1. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන යාගකර්ම **හතරක්** නම් කරන්න.

   - අශ්වමේධ, පුරුෂමේධ, ගෝමේධ, සම්මාපාස, වාජපෙය්‍ය, නිරග්ගල, රාජසූය, අග්නිහෝත්‍ර, සෝමයාග, චාතුර්මාස්‍ය, දර්ශපූර්ණමාස්‍ය ආදී යාග කර්මවලින් හතරක් නම් කිරීම ප්‍රමාණවත්

   *(ලකුණු 02)*

   (ii) බ්‍රාහ්මණ වර්ණයට නියමිත ආපද් ධර්ම කෙටියෙන් හඳුන්වන්න.

   - ක්ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණවලට අයත් ස්වධර්ම, බ්‍රාහ්මණ වර්ණයට අදාළ ආපද්ධර්ම වේ. ඒ අනුව බ්‍රාහ්මණයන්ට ආපදා අවස්ථාවකදී බ්‍රාහ්මණ ස්වධර්මවලට අමතරව පහත සඳහන් ආපද්ධර්මවල නියැලිය හැකි ය.
     - ප්‍රජා පාලනය
     - කාමයෙහි නො ඇලී ක්‍රියා කිරීම
     - කෘෂිකර්මාන්තය
     - සත්ත්ව පාලනය
     - වෙළඳාම
     - මුදල් පොලී කිරීම

   *(ලකුණු 03)*

   (iii) පූරණ කස්සපගේ මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

   - මෙතුමා පින් පව් ප්‍රතික්ෂේප කරන අකිරියවාදියකු ලෙස සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තරවන බව. (අකිරියං බ්‍යාකාසි)
   - කරන්නකු කරවන්නකු, සිඳින්නකු සිඳවන්නකු නැතැයි උගන්වන පූරණ කස්සපගේ දර්ශනය අකිරියවාදය ලෙස දැක්වෙන බව.
   - සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැයි ඉගැන් වූ බව.
   - හිංසා කරමින්, කරවමින්, සිඳමින් සිඳුවමින් පීඩා කරමින් කරවමින් ගංගා තීරයේ දකුණු කෙළවර තෙක් ගියේ වී නමුදු එයින් වන පාපයක් නැතැයි ඉගැන් වූ බව.
   - දන් දෙමින්, දන් දෙවමින්, යදිමින්, යදවමින් ගංගා තීරයේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමු



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- [illegible]
වූ බව.

"සරෝතෝ බෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ
ඡේදාපයතෝ පචතෝ පචාපයතෝ ... "

"සිය තින් කරන්නාහට ද අණ දී කරවන්නාහට ද, අත් පා සිඳින්නාහට ද, සිඳවන්නාහටද, අන්‍ය දණ්ඩෙන් පෙළන්නාහට ද ප්‍රාණඝාත හිංසා කරන්නාහට ද, එසේ කරවන්නාහට ද, බිඳුත් ගන්නාහට ද, පර අඹුවන් කරා යන්නාහට ද, බොරු කියන්නාහට ද, පවක් නැත්තේ වේ. ... ද යමෙක් (ඉතා තියුණු වූ) ඛුර නම් ආයුධයෙන් මේ පොළොවෙහි වසන (සියලු) සත්ත්වයා මරා එක ම මස් ගොඩක් එක ම මස් පිඩක් කරන්නේ ද ඒ හේතුවෙන් පවක් නැත්තේ. පාපයාගේ පැමිණීමක් නැත්තේය. සත්ත්වයන්ට හිංසා කරමින්, කරවමින්, සිඳිමින්, සින්දවමින් පීඩා කරමින්, කරවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේ නමුත් ඒ හේතුවෙන් පව් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. දන් දෙමින්, දෙවමින්, යාග කරමින්, කරවමින් ගංගා නදියෙහි උතුරු තෙරට යන්නේ නමුත් ඒ හේතුවෙන් ද පිනක් නැත්තේය. පුණ්‍යයාගේ වැඩීමක් නැත්තේය. දන් දීමෙන් ද, ඉන්ද්‍රිය දමනයෙන් ද, එක් වරුවේ කෑම ගැනීම ආදියෙන් ද, සීලයෙහි හික්මීමෙන් ද, සැබෑවක් කීමෙන් ද පිනක් නැත්තේය. පුණ්‍යයාගේ පැමිණීමක් නැත්තේය' යනුවෙන් විස්තර කොට ඇත.

(සාමඤ්ඤඵල සූත්‍රය - දීඝනිකාය)

(ලකුණු 0...

(iv) බුද්ධකාලීන භාරතීය සමාජයෙහි පැවති නාගරික ලක්ෂණ සාධක **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

- පාරිභෝගික භාණ්ඩ හුවමාරු වාණිජ ක්‍රමයෙන් ඈත් වී මුදල් භාවිතයට ක්‍රමයෙන් හුරු වී...
  උදාහරණ- මස්ස, අඩමස්ස, කහවණු, රාජ මුද්‍රාව සහිත කාසි භාවිතය.
- බැංකු කටයුතු පැවතීම
  උදාහරණ - ණය දීම, ණය ගැනීම, මුදල් පොලී කිරීම වැනි කටයුතු
- වෙළඳ නගර නිර්මාණය වීම. උදාහරණ - බරණැස, උදේනි, පාටලී පුත්‍ර, සාවත්ථිය.
- විනෝදාස්වාදය ගෙන දෙන සැණකෙළි පැවැත්වීම
  උදාහරණ- ගිරග්ගසමජ්ජ, බාලනක්ඛත්ත වැනි උත්සව පැවැත්වීම
- සුරාසැල්, ගණිකා නිවාස හා ඔට්ටු පොළවල් නාගරික සමාජයේ පැවතීම
- මුදල් ඔට්ටුවට තබා කරන සූදු ක්‍රීඩා වැනි ක්‍රියාකාරකම් පැවතීම
- භාෂාව, අදහස් උදහස්, ආහාරපාන, ඇඳුම් පැළඳුම් ආදියෙහි විසමතාවක් තිබීම
- භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී ජාත්‍යන්තර මාර්ග හා බද්ධවීම. උදාහරණ - සේ... මාවත වැනි
- උසස් වංශිකයන්ගේ හා සිටුවරුන්ගේ දරුවන් තක්සලා ආදී උසස් අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනීම
- නගරය තුළ ඇති - නැති පරතරය නිසා ධනවත් සමාජයක් හා දිළිඳු සමාජයක් බිහිවීම
- විශාල වශයෙන් මුදල් ගනුදෙනු කළ සිටුවර පන්තියක් බිහිවීම
- විවිධ වෘත්තිකයන් බිහිවීම ආදී කරුණු 05ක් ඇසුරින් විස්තර කළ යුතුය.

(v) මහාප්‍රජාපතී ගෝතමියගේ චරිතයෙන් පිළිබිඹුවන උතුම් ගුණ පිළිබඳ ඇගයීමක් කරන්න.

- **මවු ගුණය**

  සිදුහත් කුමරුන්ට, නන්ද කුමරුට හා නන්දා කුමරියට ද එක ම ආකාරයේ දරු සෙනෙහසක් පෑ ඇය රාහුල කුමරුට දැක්වූයේ ද එවැනි ම වූ මවු සෙනෙහසකි.

- **බුද්ධ ගෞරවය**

  අගනා සිවුරු පිළි දෙකක් සියතින් ම නිමවා බුදුන්වහන්සේට පූජා කිරීමට ඉදිරිපත් වූයේ අපමණ මවු සෙනෙහසින් හා අප්‍රමාණ බුද්ධ ගෞරවයෙන් යුතුවය.

- **චාම්බව**

  ශාක්‍ය කුලයේ ප්‍රමුඛතම කාන්තාව වුව ද හැමවිට ම චාම් සරල ජීවිතයක් ගතකිරීම

- **වගකීම් දැරීම**

  මහාමායා දේවිය කලුරිය කළ පසු සුද්ධෝදන රජුගේ අග බිසව තනතුර ලැබ කටයුතු කිරීම, සියලු රාජ සම්පත් අතහැර කාන්තාවන්ට පැවිද්ද ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් වී ක්‍රියා කිරීම

- **උත්සාහය හා අධිෂ්ඨානය**

  කපිලවස්තුවේදී බුදුන් වහන්සේගෙන් තෙවරක් පැවිද්ද ඉල්ලා සිටියත් එය ප්‍රතික්ෂේප වූ ව ද ඉන් නො නැවතී ශාක්‍ය කාන්තාවන් 500 දෙනකු සමඟ විශාලා මහනුවර කූටාගාර ශාලාව වෙත පාගමනින් ම පැමිණ ආනන්ද හිමියන්ගේ ද උපකාර ඇතිව කාන්තාවන්ට පැවිදි උපසම්පදාව ලබා ගැනීමට උත්සුකවීම

- **නිහතමානීබව**

  විරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර ලැබුව ද ඇය නිහතමානීව කටයුතු කිරීම

  ජීවිත අවසානයේ පිරිනිවන් පෑමට අවසර ගැනීම සඳහා පැමිණි අවස්ථාවේදී වරදක් වූවානම් සමාවන්නැයි බුදුරජාණන් වහන්සේගේ දෙපා නමැද සමාව ඉල්ලීම

  භික්ෂුණී විනයෙහි පදනම ලෙස අෂ්ට ගරුධර්ම ගෞරවයෙන් පිළිගෙන ක්‍රියාවට නැංවීම

- **ඉවසීම හා දරාගැනීම**

  නන්ද හා රාහුල කුමාරවරුන් පැවිදිවීම, සිදුහත් කුමරුගේ අභිනික්මන හා සුද්ධෝදන රජතුමාගේ අභාවය ද ඉවසා සිටීම *(ලකුණු 06)*

2. (i) ශ්‍රමණ සම්ප්‍රදායට අයත් පොදු ලක්ෂණ **හතරක්** නම් කරන්න.

   - ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීම
   - යෝග වෘත්තිය හා ඥානමාර්ගය විමුක්තිය සඳහා වන පිළිවෙත ලෙස පිළිගැනීම
   - බ්‍රහ්මචර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම
   - චින්තන නිදහස අගය කිරීම
   - කාන්තා නිදහස පිළිගැනීම
   - යාගය හා කර්ම මාර්ගය ප්‍රතික්ෂේප කිරීම



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) 'ලෝකවිදූ' බුදුගුණය හඳුන්වන්න.

- බුදුරජාණන්වහන්සේ ලෝකය ස්වභාව වශයෙන් ද ලෝක සමුදය වශයෙන් ද ලෝක නිරෝධය වශයෙන් ද ලෝක නිරෝධය පිණිස මාර්ගය වශයෙන් ද යන සියලු ආකාරයෙන් දන්නා බැවින් ද, ලෝකය අවබෝධ කළ බැවින් ද ලෝකවිදූ නම් වේ.
- තව ද සංඛාර ලෝක, සත්ත ලෝක, ඕකාස ලෝක යන තුන් ලෝකය සෑම අයුරින් ම දත් බැවින් ලෝකවිදූ නම් වන බව.
- තුන් ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට,
- දෙසුමෙන් නියම කොට - ලෝකවිදූ යැයි කියති මුනිඳුට.

(බුදුගුණාලංකාරය)

(ලකුණු

(iii) බුද්ධකාලීන කෝසල රාජ්‍යයේ පැවති පාලන ව්‍යුහය ගෙනහැර දක්වන්න.

- කෝසලය සොළොස් මහාජනපද අතර පැවැති ප්‍රධාන රාජ්‍යයන් හතරෙන් එකකි.
- මෙහි ක්‍රියාත්මක වූයේ රාජාණ්ඩු පාලන ක්‍රමයයි.
- බුද්ධකාලීන පාලකයා වූයේ පසේනදී කොසොල් රජුය.
- බුද්ධකාලීන අගනුවර වූයේ සැවැත් නුවරයි.
- පිය පුතු පරපුරෙන් රජ පදවිය උරුම විය.

  **උදාහරණ** - කොසොල් රජුගෙන් පසු ඔහුගේ පුත් විඩූඩභ කුමරු රජ විය.
- ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන බලතල සියල්ල ම කොසොල් රජු සතු විය.
- යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති හා අමාත්‍ය මණ්ඩලය මගින් බල ක්‍රියාත්මක කර ඇත.
- කොසොල් රාජ්‍යය විසින් දුර්වල අසල්වැසි රාජ්‍යවල පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කර ඇත.

  **උදාහරණ** - කාසි ජනපදය අත්පත් කර ගැනීම

(ලකුණු

(iv) පුරුෂාධිපත්‍යය යටතේ කාන්තාව තබා ගැනීමට බ්‍රාහ්මණ සම්ප්‍රදාය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- බුද්ධ කාලීන භාරතීය සමාජය පුරුෂාධිපත්‍යයෙන් යුක්ත වූ බව
- ස්ත්‍රිය බාල වියේදී පියා යටතේ ද, තරුණ වියේදී ස්වාමිපුරුෂයා යටතේ ද, මහළු වියේදී වැඩිමහල් පිරිමි දරුවා යටතේ ද ජීවත් වියයුතුය හා තනිව හැසිරීමට ඉඩ නොදිය යුතු යැයි මනුස්මෘතියේ දක්වා ඇති බව.

  "බාලෙ‍්‍ය පිතුර්වශෙ තිෂ්ඨෙද් - පාණි ග්‍රාහස්‍ය යෞවනෙ
  පුත්‍රාණං භර්තරි ප්‍රෙතෙ න භජෙත් ස්ත්‍රීස්වතන්ත්‍රතාම්"
- එසේ ම බාලකාලයේ පියා ද, තරුණ කාලයේ ස්වාමියා ද, මහලු කාලයේ පුත්‍රයා ද ඇය ආරක්ෂා කළ යුතුය. ස්වතන්ත්‍රව හැසිරීමට ඉඩ නො දිය යුතුය යන්න බ්‍රාහ්මණ ඉගැන්වීම විය. ඒ බව මනුස්මෘතියෙන් තහවුරු වෙයි.

  "පිතා රක්ෂති කෞමාරේ - භර්තා රක්ෂති යෞවනේ

- සැමියා මළ කල්හි භාර්යාව සති පූජාව නම් ආගමික කාර්යය කළ යුතුය. (සැමියා දවෙන සෑයට පැන සිය ජීවිතය පූජා කිරීම).
- සති පූජාව නො කරන කාන්තාවන් පර්ධා චාරිත්‍රය අනුගමනය කළ යුතු වීම. (පර්ධා චාරිත්‍රය යනු ස්වාමියා මළ පසු භාර්යාව ජීවත් වන්නේ නම් කිළිටි වස්ත්‍ර හැඳ රසවත් ආහාර පානවලින් වැළකී කිසිදු ආභරණයක් නො පැළඳ ස්වාමියා ම පතමින් ගෘහ දාසියක ලෙස වැඩ කරමින් සිටිය යුතු බව.)
- ඉඩ ලද සැම මොහොතේ ම කාන්තාව වරදෙහි බැඳෙන තැනැත්තියක ලෙස පහත් කොට සලකා ඇත.
- කාන්තාවට දේපළ අයිතියක් හෝ ධන පරිපාලනයක් නො දියයුතුය.
- කාන්තාව යාගහෝම ආදී ආගමික කටයුතුවලට සම්බන්ධ කර නො ගත යුතුය.

(ලකුණු 06)

(v) ගෘහස්ථ ජීවිතය තුළ කාන්තාවට හිමි තැන බුදුසමය මගින් තහවුරු කොට ඇති අයුරු පෙන්වා දෙන්න.

- ගෘහස්ථ ජීවිතය තුළ කාන්තාව, දියණියක, විචක්ෂණශීලී පඬිවරියක් විය හැකියැයි ඇගයීමට ලක් කර තිබීම.
- මවක, බිරිඳක හා උපාසිකාවක ලෙස ඇගයීමට ලක් වී ඇතිබව
- **දියණියක ලෙස**
  කෝසල සංයුත්තයේ ධීතු සූත්‍රය තුළින් දියණියක ඇගයීමට ලක් කර තිබීම.
- **මවක ලෙස**
  බ්‍රහ්මාති මාතා පිතරෝ... මව බ්‍රහ්මත්වයෙහි ලා සැලකීම
  මාතා පිතා දිසා පුබ්බා... දෙමවුපියන් පූර්ව දිසාව ලෙස සැලකීම
  මාතා පිතු උපට්ඨානං... දෙමවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස දැක්වීම
  මාතා පෙත්ති භරං ජන්තුං... මව හා පියා පෝෂණය කරන ගිහියාට සක් දෙවිඳුන් පවා නමස්කාර කරන බව සඳහන් වීම
  බුදුරජාණන් වහන්සේ මහා ප්‍රජාපතී ගෝතමිය ස්වකීය මව ලෙස සලකා සම්මානයට ලක් කළ අතර පිරිනිවන් පෑමට අවසර ඉල්ලා සිරිපතුල් අල්ලා වැඳ පිටතට යන විට බුදුරදුන් පසුගමන් යාම
  වයස්ගත වූ දෙමවුපියන්ට නො සැලකීම පරාභව හා වසලකරණ ධර්ම ලෙස පරාභව හා වසල සූත්‍රයන්හි පෙන්වා දී තිබීම
- **බිරිඳක ලෙස**
  සිගාලෝවාද සූත්‍රාගත ස්වාමි - භාර්යා යුතුකම ඉදිරිපත් කිරීමෙන් බිරිඳක ලෙස කාන්තාවට අභිමානවත් සාමාජික ජීවිතයක් ලබාදීම
  විශාඛාව පතිකුලයට යන දින සිය පියා විසින් ලබා දුන් අවවාද 10 බුදුරදුන් විසින් ඇගයීමට ලක් කිරීම
  සත්තභරියා සූත්‍රයේදී භාර්යාවන් හත් දෙනකු දක්වා ඒ අතරින් යහපත් භාර්යාවන් 4 දෙනකු ඇගයීමට ලක් කොට තිබීම
  සංවාස සූත්‍රයේදී යහපත් ගුණධර්මවලින් හෙබි කාන්තාව දෙවඟනකට සමාන කර තිබීම



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පරමාදර්ශී බිරිඳක ලෙස නකුලමාතාව බුදුරදුන්ගේ ඇගයීමට ලක් වීම භරියා ච පරමා
(බිරිඳ යනු පරම යෙහෙළිය යි).

- **උපාසිකාවක ලෙස**
  සිවුවණක් පිරිස අතර ඇයට පඤ්ච ශීලය, අෂ්ටාංග ශීලය, ආජීව අෂ්ටමක ශීලය, දස
  ආදී සිල් රකිමින් සිල්වත්, ගුණවත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව.
  ආධ්‍යාත්මික විමුක්ති සාධනයෙහි ලා ස්ත්‍රීත්වය බාධාවක් නො වීම.
  උපාසිකාවක ලෙස සුජාතා, සුමනා සාමාවතී, ඛුජ්ජුත්තරා වැනි උපාසිකාවන්ට අග තන
  ප්‍රදානය කිරීම.

(ලකුණු

3. (i) "සුකරානි අසාධූනි" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

සුකරානි අසාධූනි, අත්තනො අහිතානි ච
යං වෙ හිතංච සාධුංච, තං වෙ පරමදුක්කරං.

(ලකුණු

(ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියා දක්වන්න.

තමාට අහිත වූ අයහපත් දේ ලෙහෙසියෙන් කළ හැකිය. යම් දෙයක් තමාට හිත හෝ යහ
වේනම් එය කිරීම ඒකාන්තයෙන් ඉතා අසීරුය.

(ලකුණු

(iii) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගිහි-පැවිදි යුතුකම් හා වගකීම් නම් කරන්න.

- මෛත්‍රීසහගත වූ කයින් කරන කර්මයන් - (මෙත්තේන කායකම්මේන)
- මෛත්‍රීසහගත වූ වචනයෙන් කරන කර්මයන් - (මෙත්තේන වචීකම්මේන)
- මෛත්‍රීසහගත වූ සිතින් කරන කර්මයන් - (මෙත්තේන මනෝකම්මේන)
- නො වසන ලද දොරටු ඇති බැවින් - (අනාවටද්වාරතාය)
- ආමිස දානයෙන් හෙවත් සිවුපසය දීමෙන් - (ආමිසදානානුප්පදානේන)

**පැවිදි පක්ෂය විසින් ගිහියන් විෂයෙහි ඉටු කළ යුතු යුතුකම් 06 කි.**

- පවිකම්වලින් වළක්වත් - (පාප නිවාරෙන්ති).
- සුචරිතයෙහි යොදවත් - (කළ්‍යාණේ නිවේසෙන්ති).
- යහපත් සිතින් අනුකම්පා කරත් - (කළ්‍යාණේන මනසා අනුකම්පන්ති).
- නො ඇසූ ධර්මය අසවත් - (අස්සුතං සාවෙන්ති).
- ඇසූ ධර්මය පිරිසිදු කරත් - (සුතං පරියොදපෙන්ති).
- දෙවු ලොවට යන මග කියා දෙත් - (සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති).

(ලකුණු

(iv) කල්‍යාණමිත්‍ර සේවනය පුද්ගල ජීවිතයේ අභිවෘද්ධියට හේතුවන ආ...
ඇසුරෙන් පැහැදිලි කරන්න.

... ශ්‍රද්ධාවෙන් යුත්, ගෘහපතියෙක් හෝ, ගෘහපති පුත්‍රයෙක් හෝ, වෘද්ධ ශීලයෙන් යුත් තරුණයෙක් හෝ වෘද්ධ ශීලයෙන් යුත් වැඩිහිටියෙක් හෝ වේ ද, ඔවුන් සමග ආශ්‍රය කරයි ද, සාකච්ඡා කරයි ද, කථාවට පැමිණෙයි ද, "එම ශ්‍රද්ධාවන්තයන්ගේ ශ්‍රද්ධාවට අනුව හික්මෙයි ද, එම ත්‍යාගවන්තයන්ගේ ත්‍යාගයට අනුව හික්මෙයි ද, එම සිල්වතුන්ගේ ශීලයට අනුව හික්මෙයි ද, එම ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාවට අනුව හික්මෙයි ද, ව්‍යග්ඝපජ්ජය, මේ කල්‍යාණමිත්‍රතාවයයි." (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය- අංගුත්තර නිකාය)

- මෙයින් අදහස් කරන්නේ " සද්ධා සම්පන්න, සීල සම්පන්න, ත්‍යාග සම්පන්න, ප්‍රඥා සම්පන්න, තරුණ හෝ වැඩිහිටි කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරමින් ඔවුන් තුළ පවත්නා ශ්‍රද්ධාදී යහපත් ගුණ තමා තුළ ද ඇති කර ගත යුතුය යන්නයි."
- අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපායසහාය යන මිත්‍ර ප්‍රතිරූපකයන්ගෙන් ඉවත් විය යුතු බව ද, උපකාරක, සමානසුඛදුක්ඛ, අත්ථක්ඛායී, අනුකම්පක යන සුහද මිතුරන් ඇසුරු කළයුතු බව ද සිගාලෝවාද සූත්‍රයෙහි දක්වේ.
- ධම්මපදයේදී පාප මිත්‍රයන් ඇසුරු නො කොට කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන ලෙසට අවධාරණය කොට ඇතිබව.
- බුදුරජාණන් වහන්සේ සම්බුද්ධ ශාසනයම කල්‍යාණ මිත්‍රත්වය මත රඳා පවත්නා බව දේශනා කර ඇතිබව. (කෝසල සංයුත්තයේ කල්‍යාණමිත්‍ර සූත්‍රය)
- බාලයන් ඇසුරු නො කොට පණ්ඩිතයන් ඇසුරු කිරීම පුද්ගල අභිවෘද්ධියට හේතුවන මංගල කරුණක් බව. (මහා මංගල සූත්‍රය)
- පරිහානියට පත් වන පුද්ගලයාට අසත්පුරුෂයෝ ප්‍රියවෙති. සත්පුරුෂයා කෙරෙහි ප්‍රිය නො කරයි. යනුවෙන් පරාභව සූත්‍රයේදී දේශිත බව.
- යහපත් පුද්ගලයන් ඇසුරු කිරීමෙන් අන්‍යයන් ද යහපත් තත්ත්වයට පත්වන බවත් පුද්ගල ජීවිතයේ අභිවෘද්ධිය සැලසෙන බවත් සත්තිගුම්බ ජාතකයෙන් ප්‍රකාශ වන බව.

(ලකුණු 05)

(v) බුද්ධකාලීන ධර්මදූත සේවාවේ සාර්ථකත්වය සඳහා බුදුරදුන්ගේ ආදර්ශවත් නායකත්වය බලපෑ ආකාරය පෙන්වා දෙන්න.

- "චරථ, භික්ඛවෙ, චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං; මා එකෙන ද්වෙ අගමිත්ථ; දෙසෙථ, භික්ඛවෙ, ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියංපකාසෙථ" (මහාවග්ගපාලි)
  "මහණෙනි, බොහෝ ජනයාගේ හිත පිණිස, බොහෝ ජනයාගේ සුව පිණිස ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ අභිවෘද්ධිය පිණිස මුල, මැද, අග යහපත් වූ සර්වාකාරයෙන් පරිපූර්ණ පිරිසිදු බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරන්න." යැයි ප්‍රථම ධර්මදූත කණ්ඩායම ආමන්ත්‍රණය කළ බුදුරජාණන් වහන්සේ තමාද ලෝකයාට දහම් දෙසීම පිණිස උරුවෙලාව බලා වාඩම කළ බව.
- බුදුරදුන් ආදර්ශවත් නායකයකු ලෙස හැඳින්වීම අතිශයින් ම යෝග්‍යබව
- උන්වහන්සේගේ නායකත්වයට අභියෝග කළ හැකි කිසිදු මනුෂ්‍යයකු දෙවියකු බ්‍රහ්මයකු මිහිමත පහළ නො වනබව.



පතිරණ
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

නායකත්ව ලක්ෂණ අතර,

- බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්ව ලක්ෂණ අතර,
    - දින චර්යාව (පංච බුද්ධ කෘත්‍ය)
    - සිවුවණක් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්ම ප්‍රතිප... පිරිසක් වනතුරු තමන් වහන්සේ පිරිනිවන් නො පානා බව මාරයාට දැන්වීම
    - යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී වීම
    - සුදුස්සාට සුදුසුතැන ලබා දෙමින් සිවුවණක් පිරිසට අග තනතුරු ප්‍රදානය කිරී...
    - විවේචනවලට බිය නො වී නිර්භීතව ඕනෑම අභියෝගයකට නො සැලී මුහුණ ...
    - විමසීමට, ප්‍රශ්න කිරීමට, නිදහස් චින්තනයට ඉඩ ලබා දීම
    - ශ්‍රාවකයන්ට ආදර්ශ සම්පන්න වීම

## II කොටස

4. (i) බෞද්ධ ඉගැන්වීම්වල අන්තර්ගත ධාර්මික ධනෝපායන මාර්ග පිළිබඳ විමසීමක් කරන්...

- ධනෝපායන මාර්ග ධාර්මික පදනමක් මත ගොඩනඟා ගත යුතු බව බුදුසමයේ ඉගැන්වීමකි.
- රාසිය සූත්‍රයේ මෙය "ධම්මිකෙන අසාහසේන" යනුවෙන් දක්වා ඇත.
- වේයා තුඹසක් බඳින්නා සේ ක්‍රමානුකූලව ද, බඹරා මලින් රොන් ගන්නා සේ සාධාරණ ම අවිහිංසාවාදීව ද ගිහියා ධනය ඉපයිය යුතු බව සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ.

  "භෝගේ සංහරමානස්ස - භමරස්සේව ඉරීයතෝ
  
  භෝගා සන්නිචයං යන්ති - වම්මිකෝ වුපචීයති"

- "උට්ඨාන විරියාධිගතා, බාහාබල පරිචිතා සේදා වක්ඛිත්තා, ධම්මිකා ධම්මලද්ධා..." යනා... මගින් පත්තකම්ම සූත්‍රය ඇතුළු විවිධ සූත්‍රයන්හිදී ද උත්සාහයෙන්, වීර්යයෙන්, බාහු ... දහදිය හෙළා දැහැමි පිළිවෙතින් ධනෝපායනය සිදු කළයුතු බව පෙන්වා දී ඇත.
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී උට්ඨාන සම්පදාවෙන් මෙය පැහැදිලි කොට ඇත.
- බුද්ධ කාලයේ භාරතයේ පැවති දැහැමි ධනෝපායන මාර්ගවලට උදාහරණ ලෙස ව්‍යග්... සූත්‍රයේ දක්වා ඇත්තේ
    - කෘෂිකර්මාන්තය
    - සත්ත්ව පාලනය
    - වෙළඳාම
    - රාජ්‍ය සේවය
    - වෙනත් ශිල්පීය කර්මාන්ත
    - ආරක්ෂක සේවය යනාදිය යි.

### 1. කෘෂිකර්මාන්තය

- බුද්ධකාලීන භාරතයේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය යි.
- ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදුණේ බ්‍රාහ්මණයන්, ක්ෂත්‍රියන් හා වෛශ්‍යයන් ...
- රජවරුන්ගේ ...

- ගවයන් රැකබලා ගැනීම හා ආර්ථික කටයුතු සඳහා සත්ත්ව පාලනය බුදුසමය අනුමත කරන බව
- "නත්ථි ගෝ සමිතං ධනං" ලෙස ගවයා හා සමාන ධනයක් නැතැයි සැලකූ බව
- සතුන් දඩයම් කිරීම නො කළ යුත්තක් ලෙස දක්වා ඇත. සත්ත්ව හිංසනයෙන් තොරව සත්ත්ව කරුණාවෙන් යුතුව සත්ත්ව පාලනය කළ යුතු බව.

3. වෙළඳාම

- තොග හා සිල්ලර ලෙස ද දේශීය හා විදේශීය ලෙස ද වෙළඳාම් පැවති බව
- වණිජ්ජා සූත්‍රයේදී නොකළ යුතු වෙළඳාම් 05ක් දක්වා ඇති බව

සත්ත වණිජ්ජා - මිනිසුන් වෙළඳාම (සත්ත වණිජ්ජාති මනුස්ස වික්කයො)
සත්ථ වණිජ්ජා - අවිආයුධ වෙළඳාම
මංස වණිජ්ජා - මස් වෙළඳාම (මෘග සූකරාදීන් පෝෂණය කොට මස් පිණිස විකිණීම, මිග සූකරාදයෝ පොසෙත්වා තෙස වික්කයො)
විස වණිජ්ජා - වස විස වෙළඳාම
මජ්ජ වණිජ්ජා - මත්ද්‍රව්‍ය වෙළඳාම
වෙළඳාම අධාර්මික වන ආකාර හඳුන්වා දී ඒවායින් වැළකීමට උපදෙස් දෙනබව
තුලා කූට - හොර තරාදි භාවිතය
කංස කූට - අගය බාල කිරීම
මාන කූට - හොරට මැනීම
උක්කෝටන - අල්ලස් ගැනීම

- වඤ්චන - වංචා කිරීම යන ආදිය මෙන් ම නිකති, සාචියෝග, ඡේදන, වධ බන්ධන, විපරාමෝස, ආලෝප, සහසාකාර යනාදී වංචනික හා සාහසික ක්‍රමවලින් මිදියයුතු බව ලක්ඛණ සූත්‍රයේ දක්වා ඇත.

4. රාජ්‍ය සේවය

- පගාව, අල්ලස, වංචාව, නිකරුණේ කාලය අපතේ යැවීම යන ඒවායින් මිදී නිසි රාජ්‍ය සේවයක් සැපයීම බුදුසමය අනුමත කරයි.

5. විවිධ කර්මාන්ත හා ශිල්ප ශ්‍රේණි

- බුද්ධ කාලීන භාරතයේ විවිධ නිෂ්පාදන කර්මාන්තවල නියැලි පිරිස් සිටි අතර, එම ජීවනෝපාය මාර්ග දැහැමි ඒවා ලෙස බුදුසමය පිළිගනී.

  - ලී වැඩ කරන්නෝ
  - ලෝ කරුවෝ
  - ගල්වඩුවෝ
  - පේෂ කාර්මිකයෝ
  - සම්භාණ්ඩ නිෂ්පාදකයෝ
  - කුඹල් කරුවෝ
  - ඇත් දත් වඩුවෝ,
  - රන්කරුවෝ

යනාදී වෘත්තිකයින් නිදසුන් වේ. සත්ත්ව හිංසනයෙන් තොරව ශ්‍රම සූරාකෑමකින් තො (ලකුණු
... අනුමත කරයි.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) සප්ත අපරිහානිය ධර්ම නම් කර, ආදර්ශමත් පාලන තන්ත්‍රයක් ගොඩනැගීම සඳහා ඒවා ඉවහල් කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

- නිතර රැස්වීම
- සමගිව රැස්ව, සමගිව සාකච්ඡා කොට, සමගිව විසිරයෑම
- පෙර නො පනවන ලද නීති නො පැනවීම සහ පැන වූ නීති කඩ නො කර ආරක්ෂා කිරීම
- වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම හා ඔවුනගේ උපදෙස් පිළිපැදීම
- විවාහක කුල කාන්තාවන්ගේ හා අවිවාහක කුල කුමරියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම
- තම රාජ්‍යය ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු කිරීම හා ඒවා නඩත්තු කිරීම
- තම රාජ්‍යයට නොපැමිණි රහත් උතුමන් ගෙන්වා ගැනීම, පැමිණ සිටින රහත් උතුමන්ට රැකවරණය සැලසීම

ඉහත සඳහන් සප්ත අපරිහානිය ධර්මයන් උපයෝගී කොටගෙන ආදර්ශමත් පාලන තන්ත්‍ර ගොඩනැගීමට හැකි බව විස්තර කර තිබිය යුතු ය.

(ලකුණු

5. (i) ධර්මය සංග්‍රහ කිරීම හා සංරක්ෂණය විෂයයෙහි පළමු හා තෙවන සංගායනා ඉවහල් වූ ආ පරීක්ෂා කරන්න.

ධර්මය සංග්‍රහ කිරීම සහ සංරක්ෂණය විෂයයෙහි පළමුවන ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ

- ධර්මය - විනය ඒකරාශි කිරීම.
- ධර්ම - විනය එක්රැස් කොට ගැටලු නිරාකරණය කරමින් විනය ග්‍රන්ථ 05ක් ලෙසත් ධර්ම ග්‍රන්ථ 05ක් ලෙසත් බෙදා දැක්වීම.

  විනය

  1. මහාවග්ග පාලි
  2. චුල්ලවග්ග පාලි
  3. පාරාජිකා පාලි
  4. පාචිත්තිය පාලි
  5. පරිවාර පාලි

  ධර්මය

  1.දීඝ නිකාය
  2.මජ්ඣිම නිකාය
  3.සංයුත්ත නිකාය
  4.අංගුත්තර නිකාය
  5.ඛුද්දක නිකාය

- භාණක පරම්පරාවක් ඇති කොට ධර්මය හා විනය වාචෝද්ගතව පවත්වාගෙන යාමට වගකීම පවරා දීම.

  විනය පිටකය - උපාලි තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
  දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට

අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
ඛුද්දක නිකාය - පොදුවේ සියලු භික්ෂූන් වහන්සේලාට යනාදී ලෙසින් වගකීම පවරා දීම.

- නොපැන වූ නීති නොපැනවීමටත්, පැන වූ නීති කඩ නොකර ආරක්ෂා කිරීමටත් බුද්දානුබුද්දක ශික්ෂා කඩ නොකිරීමටත් තීරණය කළ බව
- ඡන්න හිමිට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට අනුමත කිරීම

**ධර්මය සංග්‍රහ කිරීම සහ සංරක්ෂණය විෂයෙහි තෙවන ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ**

- දුසිල් මහණුන් හැටදහසක් සසුනෙන් ඉවත් කර සසුන පිරිසිදු කිරීම.
- සත් වසරක් තිස්සේ ඇනහිට තිබූ පොහොය කර්ම නැවත ආරම්භ කිරීම.
- බුදුදහමට එකතු වී තිබූ පරවාද පන්සියයක් ඛණ්ඩනය කරමින් සකවාද පන්සියයක් තහවුරු කරමින් කතාවත්ථුප්පකරණය රචනා කිරීම
- දේශීය විදේශීය ලෙස ධර්ම ප්‍රචාරක සේවාවක් දියත් කිරීම.

*(ලකුණු 10)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අධ්‍යාපන ක්‍රියාවලිය පහදන්න.

- ඓතිහාසික තොරතුරුවලට අනුව භාරතයේ ඉපැරණි අධ්‍යාපන ආයතනයක්ව පැවති නාලන්දා විශ්වවිද්‍යාලය ක්‍රි.ව 415- 455 අතර කාල වකවානුවේ ශක්‍රාදිත්‍ය හෙවත් පළමුවන කුමාරගුප්ත රජතුමා විසින් ගොඩනගන ලදි. අනතුරුව බුද්ධ ගුප්ත (ක්‍රි.ව 455 - 467) තථාගතගුප්ත (ක්‍රි.ව 467- 500) බාලාදිත්‍ය (ක්‍රි.ව 500 - 525) යන රජවරු නාලන්දා විශ්වවිද්‍යාලයෙහි උන්නතියට විවිධාකාරයෙන් අනුග්‍රහය දක්වා ඇත
- ක්‍රි.ව 7 වන සියවස වන විට නාලන්දා විශ්වවිද්‍යාලය තුළ ආචාර්ය ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළු දස දහසක පමණ නේවාසික පහසුකම් සැලසූ සියලු පහසුකම්වලින් සමන්විත විශාල විශ්වවිද්‍යාලයක් ලෙස පැවති බව
- මෙහි අධ්‍යයනය හා අධ්‍යාපන ක්‍රියාවලිය අංශ තුනක් යටතේ සිදු වී ඇති බව
    1. ද්විතීයික අධ්‍යාපනය ලැබීමට නාලන්දාවට අවධින් ඇතුළත් වන පිරිස
    2. පළමු උපාධිය ලැබීමට ඇතුළත් වන පිරිස
    3. පශ්චාත් උපාධි ලැබීමට ඇතුළත් වන පිරිස
- නාලන්දා විශ්වවිද්‍යාලයෙහි විෂය මාලාව ප්‍රධාන විෂය ධාරා පහක් ලෙස ක්‍රියාත්මක වූ බව
    1. භාෂා අධ්‍යයන විෂය ධාරාව
    2. දර්ශන අධ්‍යයන විෂය ධාරාව
    3. බුද්ධ ධර්මය අධ්‍යයන විෂය ධාරාව
    4. ලෞකික අධ්‍යයන විෂය ධාරාව
    5. ලලිත කලා අධ්‍යයන විෂය ධාරාව
- ඉගැන්වීම් ක්‍රම ප්‍රධාන වශයෙන් තුනක් භාවිත කර ඇති බව
    1. දේශන ක්‍රමය
    2. සාකච්ඡා ක්‍රමය
    3. විවාද ක්‍රමය
- අධ්‍යාපනය ලබා දීමට ශීලභද්‍ර, ධර්මපාල, කමලශීල, දින්නාග, ආදී එක්දහස් පන්සියයක් ආචාර්ය මණ්ඩලයක් මෙහි සේවය කළ බව.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සිසුන් ඇතුළත් කරගනු ලැබුවේ ද්වාරපණ්ඩිත නම් වූ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් විසින් පැ...
  ලැබූ ඉතා ම අසීරු ප්‍රවේශ පරීක්ෂාවකින් බව.
- සෑම ශිෂ්‍යයෙකුට ම පෞද්ගලික ගුරුවරයකු සිටි බව.
- කුලපති හිමියන් යටතේ කාර්‍යාධිකාරී මණ්ඩල දෙකක් මගින් පරිපාලන කටයුතු සිදු කළ ...

(ලකුණු

6. (i) බුරුම සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ අයුරු නිදසුන් දක්වමින් පහදන්න.

- සෑම පිරිමියකු ම සිය ජීවිත කාලය තුළ තාවකාලිකව හෝ පැවිදි විය යුතු අතර, එය සං...
  පෝෂණය වීමෙහි ලා බෙහෙවින් හේතු වූ බව
- බුදුදහමේ ආභාසය නිසා කුල භේදය සම්පූර්ණයෙන් ම බැහැර වූ අතර එය සංස්...
  පෝෂණයවීම පිණිස හේතු වූ බව
- බුදුසසුනේ ආභාසයෙන් බුරුම කාන්තාවට සුවිශේෂ වටිනාකමක් හිමිවීම. අධ්‍යාපනික නි...
  ඡන්ද අයිතිය හිමිවීම, විවාහ වීම ආදි සෑම ක්ෂේත්‍රයක ම අයිතිවාසිකම් තහවුරු වීම.
- ප්‍රාථමික අධ්‍යාපනය ආරාමය තුළින් ලැබීම අනිවාර්ය වූ අතර, සෑම දෙනා ම වසර ...
  පමණ ආරාමික අධ්‍යාපනය ලැබිය යුතු වීම
- බුරුම සංස්කෘතිය තුළ පැවති නවග්‍රහ පූජාව බුදුදහම හඳුන්වාදීමේදී බුදුරජාණන් වහන්සේ ...
  ශ්‍රාවකයන් වහන්සේලා නව නමක් වෙනුවෙන් වෙන් කිරීම.
- බුරුමයේ සෑම ආරාමයක් ම ප්‍රතිමා, මූර්ති, කැටයම් ආදියෙන් සමන්විතය. එම ආරාම...
  බුද්ධ චරිතය, ජාතක කතා හා බෞද්ධ ඉතිහාසය පදනම් කොටගත් සිතුවම් නිර්මාණ පුළු...
  අතර, එමගින් සාරධර්ම පෝෂණය උදෙසා මග පෑදීම
- බුරුමයේ බෞද්ධ කලා නිර්මාණ එරට ජනයාගේ කලා කුසලතාව මූර්තිමත් කිරීම සඳහා පම...
  නොව සාරධර්ම ජනනය කිරීම විෂයෙහි සෘජු දායකත්වයක් ලැබීම
- පැගෝඩා නමින් හැඳින් වූ ස්තූප නිර්මාණය ප්‍රධාන කලා අංගයකි. ස්වේදගොන් ස්...
  ස්වේගිගොන් දාගැබ, ආනන්ද ස්තූපය ආදිය උදාහරණ ලෙස දැක්විය හැකි බව
- බුරුම වැසියන් තුළ බෞද්ධ සංස්කෘතියේ ආභාසයෙන් ආගන්තුක සත්කාරය, කරුණ...
  මෛත්‍රිය, චාම්බව වැනි ගුණධර්ම පෝෂණය වූ බව

(ලකුණු

(ii) පැරණි ලක්දිව දේශපාලන ප්‍රතිපත්තිවලට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද බලපෑම කෙතෙක් ...
තක්සේරු කරන්න.

- රජු බෞද්ධයකු විය යුතු යයි පිළිගැනීමක් පැවතීම
- ක්‍රි.ව 12 වන සියවසේ බලයට පත් නිශ්ශංකමල්ල රජතුමා චෝළ, කේරළ ආදී
  අබෞද්ධයින්ට ලංකාවේ රාජ්‍යය හිමි නැතිබව ගල්පොත සෙල්ලිපියේ දක්වා තිබීම
- අබෞද්ධ පාලකයන් ද බුදුසමයට අනුගතව කටයුතු කිරීමට යොමු වීම
  උදාහරණ - එළාර, සේන, ගුත්තික, බුද්ද පාරින්ද
- රජු බෝධිසත්ත්වවරයකු වියයුතුබවට ප්‍රචලිත වීම
  උදාහරණ: ක්‍රි.ව 10 වන සියවසේ බලයට පත් හතරවන මිහිඳු රජතුමා ඒ බව ජේතවන ?
  [illegible]

- රාජ්‍ය උරුමය ලබන්නා දළදා වහන්සේ සහ පාත්‍රා ධාතුව ආරක්ෂා කළ යුතු අතර එමගින් පාලකයාගේ රාජ්‍ය බලය තහවුරු වීම සංකේතවත් වන බවට පැවැති පිළිගැනීම
- 'රජු ශාසනයේ ආරක්ෂකයා වශයෙන් කටයුතු කළ යුතු ය' යන පිළිගැනීම උදාහරණ - දුටුගැමුණු රජතුමාගේ ප්‍රකාශය: මාගේ මේ ව්‍යායාමය...
- ක්ෂත්‍රිය වංශිකයකු රජකමට පත් වන්නේ බුදුරජාණන් වහන්සේගේ පාත්‍රා ධාතුව හා චීවර ධාතුව ආරක්ෂා කිරීමට බව දක්වෙන සිවුවන මිහිඳු රජුගේ ප්‍රකාශය
- රාජ්‍ය පාලන කටයුතුවලදී භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම

  උදාහරණ
  - ➢ දේවානම් පියතිස්ස - මිහිඳු මහරහතන් වහන්සේ
  - ➢ දුටුගැමුණු - ගෝධගත්තතිස්ස හිමි
  - ➢ සද්ධාතිස්ස - කාලබුද්ධරක්ඛිත හිමි
  - ➢ වළගම්බා - කුපික්කලමහාතිස්ස හිමි
- රජවරුන් බලයට පත් කිරීමට භික්ෂූන් වහන්සේලා කටයුතු කිරීම
- සද්ධාතිස්ස රජුගෙන් පසු ඔහුගේ වැඩිමහල් පුත් ලජ්ජිතිස්සට රජකම ලබා නො දී ථුල්ලත්ථන කුමරුට රජකම ලබාදීම
- මහාතිස්ස හිමි වළගම්බා රජු දෙවන වර බලයට පත්කිරීමට කටයුතු කිරීම
- මහානාම හිමි ධාතුසේන කුමරු බලයට පත් කිරීමට කටයුතු කිරීම
- රජවරුන් අතර ඇති වූ අර්බුද විසඳා සමගි කරවීමට භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීම

  උදාහරණ :
  - ➢ ගැමුණු රජු හා තිස්ස කුමරු අතර ඇති වූ අරගලය
  - ➢ මිහිඳු යුවරජ හා දෙවන සේන අතර ඇති වූ අරගලය,
  - ➢ මිහිඳු ඇපා හා දෙවන කාශ්‍යප අතර ඇති වූ අරගලය
- රාජාභිෂේකය සඳහා බෞද්ධ ආභාසය ලැබීම
- දෙවන සේන රජතුමා රුවන්මැලි සෑ මළුවේදී භික්ෂූන් වහන්සේගේ ආශිර්වාදයෙන් අභිෂේකය සිදුකොට අවුරුද්දක් පාසා මේ උත්සවය සිදු කළ යුතු බවට ලියවිල්ලකින් නියෝග කිරීම
- බුදුදහමින් නිර්දේශිත රාජ්‍ය පාලන මූලධර්ම භාවිතයට ගැනීම

  උදාහරණ :
  - ➢ ආමණ්ඩගාමිණීඅභය රජු මාඝාත ආඥාව පැනවීම
  - ➢ බුද්ධදාස රජතුමා තිරිසන් සතුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට සත්ත්ව රෝහල් ඇති කිරීම
  - ➢ සිරිසඟබෝ රජු මරණීය දණ්ඩනයට ලක්වූවන් නිදහස් කිරීම
  - ➢ භාතිකාභය රජු ගවමස් කෑම දඩ ගෙවිය යුතු වරදක් කොට නීති පැනවීම
  - ➢ බුද්ධදාස, උපතිස්ස, පස්වන කාශ්‍යප යන රජවරුන් දශරාජ ධර්මයෙන් සිව් සඟරාවතින් යුතුව හා සතර අගතියෙන් බැහැරව පාලන කටයුතු කිරීම (වෙස්සගිරි සෙල්ලිපිය)

(ලකුණු 10)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. (i) භාරතීය ස්තූප කලාවෙන් ශ්‍රී ලාංකේය ස්තූප ...
පෙන්වා දෙන්න.

**භාරතීය ස්තූපයේ ලක්ෂණ.**

- ප්‍රදක්ෂිණාපථයක් (වේදි) පැවති අතර එයට පිවිසීමට පියගැට (සෝපාන) පෙළි ... ඇත.
- ගර්භය මුදුනේ හර්මිකා නමින් හැඳින් වූ ගල් ගරාදි වැටක් සහිත හතරැස් කො... තිබීම.
- හතරැස් කොටුව මැද ශිලා ඡත්‍රය දරා සිටි යෂ්ටිය (යූපය) පිහිටා ඇත
- යූපය මත ඡත්‍රයක් විය. ගර්භය අර්ධ ගෝලාකාරය. ස්තූපය වටා තොරණ හතරක් ...

**ශ්‍රී ලාංකේය ස්තූප කලාව වෙනස් වන ආකාරය**

- ප්‍රදක්ෂිණාපථය වෙනුවට ලාංකේය ස්තූපයේ නිර්මාණය කර ඇත්තේ පේසා වළලු තු... එක එකක් ක්‍රමානුකූලව කුඩා වන ලෙස නිර්මාණය කර ඇත.
- මුල් කාලීන ලාංකේය ස්තූපවල ඉහළ සෝපාවේ පියගැට පෙළ දිගේ නියත පරතරයකි... හිස් නිමවා තිබුණි. මෙය හත්රිවේදය නමින් හඳුන්වා ඇත. පසුකාලයේදී එය ඉවත් ක...
- මුල් කාලීන ලාංකේය ස්තූපවල ගර්භයට සම්බන්ධව ලීයෙන් කළ මුදුන් වැටක් (මු... තිබුණි. පසු කාලයේදී එම නිර්මාණය අභාවයට ගොස් ඇති අතර බදාමවලින් එය සං... කර ඇත.
- භාරතීය ස්තූපයේ වූ හර්මිකාව නමින් හැඳින් වූ ගල් ගරාදි වැටක් සහිත හතරැස් කො... කාලීන ලාංකේය ස්තූපවල පැවැතිය ද පසු කාලයේ දී හතරැස් කොටුව වටා පැවති ග... ඉවත්ව ඒ වෙනුවට ගඩොල් හා හුණු බදාමයෙන් පුරවා සකස් කොට නිමවීම.
- මධ්‍යතන යුගයේදී ලාංකේය ස්තූපවල දේවතා කොටුව නමින් හැඳින් වූ නවාංගයක් එ... එය ඉදිකරන ලද්දේ හතරැස් කොටුව මතය. දේවතා කොටුවෙහි සතරවරම් දේව රූප නි... කිරීම.
- මුල් කාලීන ලාංකේය ස්තූපවල ද යූපය සවිකර තිබුණි. පසු කාලයේදී එය ඉවත් කර ඒ ... කොත් කැරැල්ල යොදන ලදී.
- මුල් කාලීන ලංකාවේ ස්තූපවල එක් ඡත්‍රයක් පැවතුණි. පසුකාලයේදී එය ඡත්‍රාවලියක් ... විය. අනතුරුව ඡත්‍රාවලිය වෙනුවට කොත සවිකරන ලදී. කොත මත චූඩාමාණික... නිර්මාණය කර ඇත.
- ගර්භයේ හැඩය අනුව ලාංකේය ස්තූප ප්‍රධාන ආකෘති හයකට වර්ග කෙරේ.
  - ඝණ්ඨාකාර (සීනුවක හැඩය) - අනුරාධපුර ථූපාරාමය, ලංකාරාමය.
  - ඝටාකාර (කලයක හැඩය) - කතරගම කිරිවෙහෙර, සෝමාවතී ස්තූ...
  - බුබ්බුලාකාර (දිය බුබුලක හැඩය) - රුවන්මැලිසෑය, අභයගිරිය, ජේතවනය...
  - ආමලකාකාර (නෙල්ලි ගෙඩියක හැඩය) - මිහින්තලය කණ්ටක චෛත්‍ය
  - පද්මාකාර (පියුමක හැඩය) - දෙමළ මහා සෑය සහ යුධගනා ස්තූප...
  - ධාන්‍යාකාර (වී ගෙඩක හැඩය) - කැලණි ස්තූපය මෙම වර්ගයට අයත්

- ... මෙන් ම දාර්ශනික අංශයෙන් ද සමන්විත වූ බව
- විද්වත් මතයට අනුව ස්තූපාංග මගින් බුද්ධනමට අදාළ ධර්ම කොටස් විවරණය වන බව ඒ අනුව.
  - **පාදම** - සූවාසූ දහසක් ධර්මස්කන්ධය
  - **කුන්මහල් පේසාව** - ත්‍රිවිධ රත්නය
  - **ගර්භය** - සත්තිස් බෝධි පාක්ෂික ධර්ම
  - **හතරැස් කොටුව** - චතුරාර්ය සත්‍යය
  - **දේවතා කොටුව** - දිව්‍ය ලෝක හෝ සතර වරම් දෙවිවරු
  - **කොත් කැරැල්ල** - නවාංග ශාස්තෘ ශාසනය
  - **කොත** - නිර්වාණය සංකේතවත් වේ.

- චෛතියඝර, (වටදාගෙය) වාහල්කඩ, මලසුන් ගෙවල් ආදී ස්තූප උපාංග ද ලාංකේය ස්තූපයේ සුවිශේෂ ලක්ෂණ ලෙස හඳුනාගත හැකි බව
- ස්තූපය වටා සලපතල මළුවක් ද ඒ වටා ඇත් පවුරක් ද නිර්මාණය කොට තිබූ බව
- පියගැටපෙළ දෙපස කොරවක් ගල් ද, පඩිපෙළ මුලට සඳකඩපහණ ද එකතු කොට තිබූ බව
- ත්‍රිවිධ චෛත්‍ය සංකල්පය ජනප්‍රියත්වයට පත්වීමත් සමඟ විහාරස්ථානයක අත්‍යවශ්‍ය පූජනීය වස්තුවක් ලෙස ස්තූපය ද එක් විය.

*(ලකුණු 10)*

(ii) **සමාජයට සාරධර්ම සම්ප්‍රේෂණය කිරීම පිණිස චිත්‍ර කලාව යොදාගත හැකි බව ශ්‍රී ලාංකේය විහාර බිතුසිතුවම් ඇසුරෙන් ප්‍රකට කරන්න.**

- ශ්‍රී ලාංකේය විහාර බිතුසිතුවම් කලාව අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, නූතන යනුවෙන් ප්‍රධාන යුග හතරකට අයත්වන බව.
- අනුරාධපුර යුගයට අයත් විහාර සිතුවම් හිඳගල, අම්පාර ගොනාගොල්ල යනාදී ස්ථාන
- පොළොන්නරු යුගයට අයත් චිත්‍ර: මහියංගණ ස්තූපය, දිඹුලාගල, පුල්ලිගොඩ, ගල් විහාරය, ලංකාතිලකය, තිවංක පිළිමගෙය ද,
- මහනුවර යුගයට අයත් විහාර සිතුවම්-දෙගල්දොරුව, දඹුල්ල, රිදී විහාරය, මැදවල විහාරය, සූරියගොඩ, මහනුවර දළදා මාලිගාව, ගඩලාදෙණිය, දනගිරිගල, ඹඹරගල, දොඩම්තලේ, ගංගාරාමය යන ස්ථාන ද,
- නූතන යුගයේ විහාර චිත්‍ර: කැලණියේ අලුත් විහාරය, බොරැල්ලේ ගෝතමී විහාරය, සේදවත්තේ වෙහෙරගොඩැල්ල විහාරය යන ස්ථාන ද උදාහරණ වේ.
- මෙකී යුගවලට අයත් විහාර සිතුවම් බොහොමයකට වස්තු විෂය වී ඇත්තේ බුද්ධ චරිතය බෝසත් චරිතය, ජාතක කතා සහ ශාසන ඉතිහාසයේ විශේෂ සිදුවීම් යනාදිය යි.
- බෞද්ධ චිත්‍ර කලාව සමාජයට සාරධර්ම සම්ප්‍රේෂණය කිරීමේ මාර්ගයක් ලෙස බුදුසමයේ ඉගැන්වීම ඉතා සරලව හා සියුම් ලෙස ජන විඥානයට එකතු කළ බව


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සෑම සංඝාරාමයක ම විහාරය අනිවාර්ය අංගයක් වී ඇති අතර, ඒ ...
  සිතුසිතුවම්වලින් අලංකාර වී ඇති බව
  **වෙස්සන්තර ජාතකය** - දන්දීම පිළිබඳව ද
  **සස ජාතකය** - දන් දීමේ අභ්‍යාස පිළිබඳව ද
  **සාම ජාතකය** - පිවිතුරු ජීවිතයේ බලය පිළිබඳව ද
  **සත්තිගුම්බ ජාතකය** - පාප මිත්‍ර හා කල්‍යාණ මිත්‍ර සේවනයෙහි ඵලවිපාක පිළිබඳ...
  **මණිකණ්ඨ ජාතකය** - ගේහසිත ප්‍රේමය කෙරෙහි ඇති බැඳීමෙහි ඵලවිපාක ...
  සාරධර්ම සම්ප්‍රේෂණය කරවන බව
- පිං පව් නොසලකා කටයුතු කිරීම දිට්ඨධම්මවේදනීය වශයෙන් විපාක දෙන අයුරු ...
  චිංචාමානවිකා කතා පුවත් සිතුවමට නැගීමෙන් පෙන්වා දී ඇති බව
- දිව්‍යලෝක හා අපාය දර්ශන සිතුවමට නැගීමෙන් මරණයෙන් මතු කර්ම විපාක ...
  ආකාරය සමාජයට සම්ප්‍රේෂණය කර ඇතිබව
- වෙහෙර විහාර වන්දනා කිරීමට යන සැදැහැවතුන්ට සාරධර්ම සන්නිවේදනය වීමට ...

(ලකුණු ...)

8. (i) "ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ පෝෂණයට බුදුසමයෙන් නොමඳ ආලෝකයක් ලැබී ඇත."
සාකච්ඡා කරන්න. (ලකුණු ...)

- නාට්‍ය කලාවේ ආරම්භය කවදා කොතැනකදී කෙසේ සිදු වී ද යන්න නිශ්චිත නො... ලෝකයේ විවිධ සංස්කෘතීන්හි නාට්‍ය කලාව ආගමික විශ්වාස හා සිතුම්-පැතුම් පදනම් ... ඇරඹිණැයි විශ්වාස කෙරේ.
- ලංකාවේ බුද්ධාගම මුල් බැස ගැනීම හා පසුකාලීන මහායාන අදහස් ද මුල් කර ගනිමින් ... නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශය සිදු වූ බව
- මුල් බුදුසමය හා ථෙරවාද බුදුසමය තුළ නාට්‍ය කලාවන්ට වැඩි ඉඩක් නො ලැබුණ ද මහායාන ආභාසයත් සමග සේන්දු වූ පුද - පූජා අභිචාර විධීන්ට අනුගතව පසුකාලීනව ලංකාවේ නා... කලාවක් බෞද්ධ තේමා ඇසුරු කොට බිහි වූ බව
- පසුකාලීනව නාට්‍ය ලක්ෂණවලින් යුතුව බෞද්ධ පුද - පූජා සකස් විය. එබඳු පූජා කර්ම...
  **උදාහරණ ලෙස**
  - ආලවක දමනය
  - යුගාසන බණ
  - දොරකඩ අස්න
  - මිලින්ද ප්‍රශ්නය
  - සූවිසි විවරණ ආදිය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත්ව ඇතිබව
- මෙම සෑම පූජා කර්මයක ම අනුකරණය, සමාරෝපණය, සංවාද භාවිතය, චරිත නිරූපණ... වස්ත්‍ර භාවිතය වැනි නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බව
- මෙසේ නාට්‍ය කලාව බෞද්ධ ආභාසයෙන් ලද දියුණුතම අවස්ථාවක් ලෙස ජාතක ... ඇසුරෙන් නාට්‍ය නිර්මාණය වීම හඳුනාගත හැකි ය. ජාතක කථා ඇසුරෙන් නිර්මාණය ... ලද නාට්‍ය ජනයා අතර ජනප්‍රියත්වයට පත් වූයේ ඉතා වේගයෙනි.
- **ජාතක කථා ඇසුරින් නිර්මාණය කළ නාට්‍ය ලෙස,**
  - සඳකිඳුරු නාඩගම - චන්ද්‍රකින්නර ජාතකය ඇසුරින් ද
  - විදුර නාඩගම - විදුර ජාතක කථාව ඇසුරින් ද
  - මනමේ නාඩගම - ...

- ➢ ලෝමහංස නාට්‍යය - මහාපදුම ජාතකය ඇසුරින් ද
- ➢ පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - සද්ධර්මාලංකාරයේ එන ස්වර්ණතිලකා කතා වස්තුව ඇසුරෙන් ද,
- ➢ හව කඩතුරාව නාට්‍යය - ස්වර්ණහංස ජාතකය ඇසුරින් ද
- ➢ මහාසාර නාට්‍යය - මහාසාර ජාතකය ඇසුරින් ද
- ➢ කදාවළලු නාට්‍යය - සේරිවාණිජ ජාතකය ඇසුරින් ද
- ➢ පබාවතී නාට්‍යය - කුස ජාතකය ඇසුරින් ද සකස් කර ඇත.

- මේ අතරින් මනමේ, වෙස්සන්තර, ලෝමහංස, හව කඩතුරාව, පේමතෝ ජායතී සෝකෝ යන නාට්‍යය මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණයන්ය. මෙම විශිෂ්ට නිර්මාණ සඳහා එතුමන් ජාතක කතා මෙන් ම බුද්ධහමේ මූලික ඉගැන්වීම් ද වස්තු විෂය කොට ගෙන තිබේ.
- මනමේ නාට්‍යය පළමු වරට රඟ දක්වන්නේ 1956 දී ය. මෙය කෝලම් ශෛලිය ද, නාඩගම් ශෛලිය ද භාවිත කරමින් නිර්මාණය කර ඇත.
- ලෝමහංස නාට්‍යයේ තේමාව ලෙස හඳුන්වන්නේ වයස්ගත වී තරුණ බිරිඳක සරණපාවා ගැනීමෙන් සිදුවන ව්‍යසනයයි. මෙම නාට්‍යය ද බෞද්ධ ආභාසය අනුව යමින් නිර්මාණය කො ඇත.
- "පේමතෝ ජායතී සෝකෝ" නාට්‍යය සද්ධර්මාලංකාරයේ එන ස්වර්ණතිලකා කතා වස්ත ඇසුරෙන් නිර්මිත රමණීය දෘශ්‍ය කාව්‍යයකි. එය ස්ත්‍රිය සම්බන්ධයෙන් ප්‍රචලිත ගතානුග දෘෂ්ටිය නිශේධනය කරමින් නිර්මිතය. උද්දාලක නම් බමුණු පඬිවරයා ස්ත්‍රියකගේ රූපයට වීම නිසා විනාශ වී යන ප්‍රවාදය පෙරටු කොට නිර්මාණය කර ඇත.
- කෝලම්, සොකරි, ජහුටා ආදී ගැමි නාට්‍ය විශේෂ තුළ ද බෞද්ධ ආභාසය දැකිය හැකිය.
- කෝලම් නාට්‍යයවල විශේෂත්වය වන්නේ කතාව අවසානයේ ආගමික උපදේශයක් ලබා දීම
- ශ්‍රී ලංකාවේ මුල් කාලීන සමාජයේ සොකරි නාට්‍යය ඉතා වැදගත් තැනක් ගිම් විය. සො නාට්‍යයේ එන සන්නිවේදනය තුළ ආගමික සන්නිවේදන ලක්ෂණයන් ද පිළිබිඹු වේ. ඇරඹෙන්නේ තෙරුවන් වැඳ අවසර ගැනීමෙනි.
- මේ ආකාරයට නාට්‍ය කලාවට බෞද්ධ අභාසය ලැබී ඇති අතර එම නිර්මාණවල දේව විශ් ද අන්තර්ගත ය. ඒ අනුව එයින් ආගමික සන්නිවේදන ක්‍රියාවක් ඉටුවන බව පැහැදිලි වේ.
- මේ අනුව බුද්ධහම ඇසුරු කරගෙන බෞද්ධ නාට්‍ය කලාවක් ඇරඹුණු බවත්, එය බෞද්ධ නා පිළිබඳ අධ්‍යාපනයක් ලබා දෙමින් විකාශය වූ බවත් කිව හැකි ය.

(ලකුණ

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** විවරණ සපයන්න.

(1) බෝධිඝරය

(2) ශිලාසෝපස්ථානය

(3) පූජාවලිය

(4) අභයගිරි සම්ප්‍රදාය

(ලකුණු 05× 2 =

1. බෝධිඝරය

...වෙනුවෙන ලැබ පට පියස්සක් සහිත මණ්ඩපයකි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- බෝධිඝරයක් නිර්මාණය කොට ඇත්තේ බෝධිය විවෘතව තබමින් ඒ වටා වහළක් සහි ගොඩනැගිල්ලක් වශයෙනි. ඒවා වෘත්තාකාර, ආයතාකාර, සමචතුරශ්‍රාකාර, මණ්ඩලාක වශයෙන් සැලසුම් කොට ඇත. ගොඩනැගිල්ලේ සිවු දෙසින් පිහිටුවා ඇති දොරටුවලට කෙළි ආසන 04ක් ඇත. ඊට පිටතින් ප්‍රදක්ෂිණා පථය පිහිටුවා ඇත. බෝධි වෘක්ෂයට ජලය ගෙනයාම කුඩා ජල මාර්ගයක් ද විය.
- බුදුරජාණන් වහන්සේට දැක් වූ ගෞරවය බෝධීන් වහන්සේට ද පළ කිරීමක් ලෙස හා බෝධී වහන්සේගේ ආරක්ෂාව හා අලංකාරය සඳහා ද බෝධි වන්දනාවේ යෙදෙන බැතිමතුන් අව්වෙන්, වැස්සෙන්, ඇතිවන පීඩා වැළැක්වීම සඳහා ද බෝධිඝරය නිර්මාණය විය.
- ඉන්දියාවේ සාංචි, අමරාවතී, භාරුත්හි කැටයම් පුවරුවල බෝධි වෘක්ෂය වටා තනන ලද මහ 02 කින් හෝ 03කින් යුතු ගොඩනැගිලි ආකෘති දක්වා ඇත.
- දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා බෝධිඝරයක් පැවතිණ.
- ශ්‍රී ලංකාවේ පළමු වරට ශ්‍රී මහා බෝධිය වටා බෝධිඝරයක් තැනුයේ දේවානම්පියතිස්ස රජතුමා විසිනි. පසුව ඒ සඳහා අභය රජු ශිලාමය වේදිකාවක් තනා ඇත.
- පස්වන ශතවර්ෂයේදී ධාතුසේන රජතුමා ශ්‍රී මහා බෝධියට නව බෝධිඝරයක් කරවා ඇත.
- ඉන් අනතුරුව ලංකාවේ බොහෝ බෝධීන් වහන්සේලා වෙනුවෙන් බෝධිඝර ඉදිකර ඇත. ඒවා නිදසුන්, පන්කුලිය, වෙස්සගිරිය, අභයගිරි විහාරය, මඟුල් මහා විහාරය, තොලුවිල, පුලියන්කුලම සීගිරිය ආදිය දැක්විය හැකි ය.
- දැනට තරමක් දුරට ආරක්ෂා වී ඇති කලාත්මක බෝධිඝරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම ප්‍රදේශයෙන් හමු වී ඇත. එය චතුරස්‍රාකාර හැඩයෙන් යුතුය. දෙපසින් ද්වාර ප්‍රවේශ 02කි. මාල 02 කින් යුතු එම බෝධිඝරය ක්‍රිස්තු වර්ෂ 8 වන සියවසට අයත් සේ සැලකේ.

## ii. ගිලානෝපස්ථානය

- ගිලනුන්ට උපස්ථාන කිරීම බෞද්ධයාගේ උසස් චාරිත්‍ර ධර්මයක් මෙන් ම එය උසස් සමාජ සේවයක් ද වන බව.
- බුදුන් වහන්සේ විසින් ම පූතිගත්තතිස්ස හිමියන්ට ගිලානෝපස්ථානයේ යෙදීමෙන් එහි වැදගත්කම ආදර්ශයෙන් ප්‍රකට කළ බව.
- බුදුන් වහන්සේ උදරාබාධයකින් පෙළුණ භික්ෂුවකට සියතින් ම උපස්ථාන කොට භික්ෂූන් අමතා දේශනා කළේ "යමෙක් ගිලනුන්ට උපස්ථාන කරන්නේ ද ඔහු මට උපස්ථාන කළාක් වැනි යි" යනුවෙනි.
- මහණෙනි, රෝගී භික්ෂුවට ආචාර්යවරයෙකු, උපාධ්‍යායවරයෙකු වේ නම් ඔහු විසින් දිවිහිමියෙන් රෝගී වූ ශිෂ්‍යයාට උවටැන් කළ යුතු අතර, රෝගියාගේ සුවය නිරතුරු බලාපොරොත්තු විය යුතු බව
- යම් ශිෂ්‍යයකු හෝ අන්තේවාසිකයකු ඇත්නම් ඔහු විසින් දිවිහිමියෙන් ආචාර්ය උපාධ්‍යාය වහන්සේලාට උපස්ථාන කළ යුතු අතර රෝගියාගේ සුවය නිරතුරු බලාපොරොත්තු විය යුතු බව
- යම් රෝගයකුට ඒ කිසිවෙක් නැත්නම් ඒ [illegible]

PAST PAPERS WIKI

... බුදුන් වහන්සේ වදාළ බව ... සුවූ ය. රෝගීන් ද උපස්ථානයට පහසු වන ... සැලකුවට අසනීප ...

- **මෙහිදී බුදුන් වහන්සේ උපස්ථායකයකු සතුව තිබිය යුතු ගුණාංග පහක් වදාළ හ.**
  - i. දක්ෂ උපස්ථායකයා ගිලනුන්ට සුදුසු බෙහෙත් ආහාර ආදිය පිළියෙළ කර දෙයි.
  - ii. හිත අහිත ආහාරපාන දැන ප්‍රත්‍ය බොජුන් සපයයි. අහිතකර බොජුන් ඉවත් කරයි.
  - iii. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් නොව මෙත් කුළුණෙන් උවැටන් කරයි.
  - iv. මළ මූත්‍ර සෙම්, සොටු ආදිය ඉවත් කිරීමේදී පිළිකුල් නූපදවයි.
  - v. වරින්වර ගිලනාගේ හිත සැනසෙන පරිදි කථා කියයි, උපදෙස් දෙයි.

- **ගිලනා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද වදාළ බව**
  - i. කැප වූ ආහාරපාන ගනියි.
  - ii. කැප වූ ආහාරපානයෙහි පමණ දනී.
  - iii. නියමිත පරිදි බෙහෙත් පාවිච්චි කරයි.
  - iv. උපස්ථායකයාට තමාගේ අසනීප තොරතුරු නො සඟවා දක්වයි
  - v. ධෛර්ය උපදවා තියුණු රුජ වේදනාවන් ඉවසයි.
- බුදුරදුන් විසින් ඉතා මාහැඟි යැයි අගය කළ ගිලානෝපස්ථානය භික්ෂු සමාජය තුළ මැනවි... ක්‍රියාත්මක වූ බව
- එසේ ම එය ගිහි බෞද්ධයන් අතර ද මැනවින් ප්‍රචලිත වී ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන බව

### iii. පූජාවලිය

- පූජාවැල යන අදහසින් 'පූජාවලිය' යන නම යොදා ඇත.
- බුදුදහමේ ඇතුළත් ආමිස හා ප්‍රතිපත්ති යන පූජා දෙවර්ගයෙන්ම පුද සත්කාර ලැබීමට බුදුර... සුදුසුව සිටි අයුරු විස්තර කරමින් ලියා ඇත.
- මෙහි කතුවරයා මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් ය.
- කතුවරයා මෙයින් අපේක්ෂා කෙළේ නව අරහාදී බුදුගුණ අතරින් 'අරහං' බුදුගුණය වර්ණ... කිරීමයි.
- මෙහි පරිච්ඡේද 34 කින් යුතුවන අතර සෑම පරිච්ඡේදයක්ම පූජා සංග්‍රහ කථා, පූජා ... යනුවෙන් හඳුන්වා ඇත.
- බෞද්ධ සාරධර්ම සම්ප්‍රදායයෙන් තමන්ගේත්, අනුන්ගේත් අර්ථ සිද්ධිය උදා කරලීමේ අ... මෙම ග්‍රන්ථය නිර්මාණය කිරීමට හේතු පාදක වී ඇත.
- මෙම ග්‍රන්ථය කියවා බැලූ දෙවන පැරකුම්බා රජු කෙතරම් ප්‍රසාදයට පැමිණියේ දැයි පූජා... ම සඳහන් කොට ඇත. මෙරට රජකු මෙපරිද්දෙන් පිදූ එක ම සිංහල මහා බණ පොත පූ... යි.
- පූජාවලියේ කතුවරයා සිය ග්‍රන්ථය හඳුන්වන්නේ ධර්ම ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් ලෙස යි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- පූජාවලියේ ...
වංශය ද අන්තර්ගත වේ.
- හැකි සෑම තැනකදී ම ධර්මෝපදේශ මතු කර දැක්වීමට කතුවරයා උත්සාහ දරා ඇත.
- මෙහි ජාතක කතා 163ක් අන්තර්ගත ය.
- කතුවරයා ජාතක කතා දැඩි සේ ප්‍රිය කළ නිසා බුදුන් යශෝධරා, රාහුල, ආනන්ද, ... ආදීන් පිළිබඳව කරුණු දක්වන තැන්වලදී එසේ ජාතක කතා මතුකර ඇත.
- මෙහි 34 වන පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාව පිළිබඳ ඓතිහාසික තොරතුරු සපයා ඇත.
- එසේ ම කලා ශිල්ප, ආභරණ, තූර්ය භාණ්ඩ, වෘක්ෂලතා, සිවුපා හා පක්ෂීන් පිළිබඳ ... ද පූජාවලියෙහි ඇත.
- මේ වූ කලී සරල සුගම බස් වහරකින් සමන්විත වන අතර බෞද්ධ ජනයා නිරතුරු ... ගෙන ඇති බණ පොතක් ලෙස ද සැලකිය හැකි ය.

iv. අභයගිරි සම්ප්‍රදාය

- ක්‍රි. පූ. පළමුවන සියවස තෙක් මෙරට වාසය කළේ මහාවිහාරය මුල් කරගත් ... වහන්සේලා බව.
- වට්ටගාමිණීඅභය රජු දෙවනවර බලයට පත්වීමෙන් අනතුරුව ගිරි නිගණ්ඨාරාමය බිඳ ... ස්ථානයෙහි ගොඩනැගූ ආරාමය කුපික්කලතිස්ස හිමියන්ට පූජා කළ බව
- මෙය අභයගිරි විහාරය, අභයුත්තර විහාරය, උත්තර විහාරය යන නමින් ද හැඳින් වූ බව
- පසු කාලයේදී අභයගිරිය වෙන ම ආයතනයක් වශයෙන් ද ක්‍රියාත්මක වූ බව
- පසුව ඉදිකළ සෝමාරාමය, දක්ඛිණගිරි විහාරය, සාලියාරාමය මෙයට ඇතුළත් වූ බව
- අභයගිරිය වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි හිමියන්ගේ අදහස් පිළිගෙන ක්‍රියාත්... බව
- නව දාර්ශනික සංකල්ප ජනකාන්ත ඇදහිලි හා පුද පූජා ශ්‍රී ලාංකික ජන සමාජයට හ... දුන් බව, උදාහරණ - බෝධිසත්ත්ව සංකල්පය
- විවිධ පුද පූජා ආරම්භ කිරීම, ජය පිරිත, සීවලී පිරිත, ගිනි පිරිත, ජලනන්දන පිරිත, දළදා ... හා පෙරහැර ආරම්භ කිරීම
- මහායාන ධර්මය රන් පත්, තඹ පත් ආදියෙහි ලියා චෛත්‍යවල තැන්පත් කිරීම.
- ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාවට මුල් තැනක් ලබාදීම
- භක්තිවාදය ප්‍රචලිත කිරීම තුළින් පූජා සංස්කෘතියක් ස්ථාපිත කිරීම
  - බෝධියට නානුමුර පූජා පැවැත්වීම
  - බෝධිසත්ත්ව ප්‍රතිමාවලට රාජාභරණ පැළඳවීම
  - බුද්ධාභිෂේකය
- කලාත්මක ක්ෂේත්‍රයේ වර්ධනයට කටයුතු කිරීම.
- අලංකාර ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, පොකුණු නිර්මාණය කිරීම. උදාහරණ - රත්නප්‍රාසා... වැනි අලංකාර විහාර ... නිර්මාණ